ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය පැය තුනයි. |
|---|---|---|

**සැලකිය යුතුයි :-**

- 1 කොටසේ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **11** කොටසින් ප්‍රශ්න **හතරකටද** 111 කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

---

**1 කොටස**

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද (ii) යටතේ ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කරන්න.

(i) මල්වතු ඔය(කදම්බ නදී) වලවේ ගඟ, පරාක්‍රම සමුද්‍රය, නාච්චදූව වැව,ගන්නොරුව, අලිගල,පාහියන්ගල, අනුරාධපුරය, මහාතිත්ථ,මඩකලපුව,කැළණිය, දඹකොළ පටුන — ලකුණු 12

(ii) පෘතුගාලය, සුවස් ඇළ, ගෝව, ඉතාලිය, චීනය තුර්කිය — ලකුණු 06

(ආ) (i) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.


*A* - ලංකාවේ උතුරු ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු බාරව ක්‍රියාකළ මිෂනාරි සමාගම

*B* - පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධව නීති ඇතුළත් කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය කරවූ රජතුමා

*C* - පෘතුගීසින් අන්ත පරාජයට පත්කරමින් සීතාවක රාජසිංහ රජු පෘතුගීසින් හා සටන් වැදුණු ස්ථානය

*D* - 1917 දී සාර්ථක ඔක්තෝබර් විප්ලවය දියත් කළ බෝල්ෂෙවික් නායකයා — ලකුණු 04

- A හා B යටතේ දක්වා ඇති පිංතුර අධ්‍යයනය කොට,අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.



A

(ii) 1. A රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?
2. මෙතුමා නායකත්වය දුන්නේ කුමන පුනරුද ව්‍යාපාරයටද?
3. මොහු විසින් ආරම්භ කළ පුවත්පතේ නම කුමක්ද?
4. අධ්‍යාපනයේ දියුණුව උදෙසා 1872 දී ඉදිකළ පාසලේ නම කුමක්ද?

ලකුණු 04



(iii) 1. B රූපයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

www.edudept.up.gov.lk

**II කොටස**

02. (i) පහත දැක්වෙන A B C ප්‍රශ්න සඳහා පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A - ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ

B - මෙරට තතුසියැසින් දැක දැක හැදින රොබට් නොක්ස් විසින් රචනා කළ ග්‍රන්ථය

C - වල්ලිපුරම් රන් සන්නස අයත් වන මූලාශ්‍ර වර්ගය (ලකුණු 3)

(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 4)

(iii) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iV) ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා විනාශය සිදුවන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 6)

03. (i) මහාවංශයේ සඳහන්වන වාපී ගම් තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති වචනවල අර්ථය අනුපිළිවෙළින් ලියන්න.

A – අචරණ B – පුර කමත

C – නකර D – පරිකිත්ත ගම් (ලකුණු 4)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iV) රටේ රජු විසින් අංශ **තුනකින්** තම ජනතාවට යුතුකම් ඉටුකළ යුතුය. දුටු ගැමුණු රජතුමාගෙන් එම යුතුකම් ඉටු වූ බව උදාහරණ සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 6)

04. (i) පහත දැක්වෙන A B C ප්‍රශ්න සඳහා පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A - පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රධානතම හේතුව

B - බෙලිගලදළදා මැදුරක් තනවා දළදා වහන්සේ එහි තැන්පත් කිරීමට ක්‍රියා කළ රජතුමා

C - රජුගේ සහෝදරියගේ පුතාට රජකම ලැබීම දක්නට ලැබෙන රාජ්‍ය සමය (ලකුණු 3)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති තොරතුරු වලට අදාල පිළිතුරු සපයන්න.

A - පළමු වන භුවනෙකබාහු රජතුමා විදේශ වෙළඳ සබඳතා ඇති කර ගැනීම සඳහා තානාපතීන් යැවූ රට

B - කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා


C - ගම්පොළ රාජ්‍ය සමයේ මෙරට ආක්‍රමණය කළ චීන සෙන්පතියා

D - vi වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ යාපනය ජයගැනීමට හමුදාව මෙහෙය වූ තැනැත්තා (ලකුණු 4)

(iii) විදේශ ආක්‍රමණිකයින් පරාජය කොට රට තුළ දේශපාලනික එක්සත් බවක් ඇති කිරීමට ii පරාක්‍රමබාහු රජු ක්‍රියා කළ අයුරු නිදසුන් **දෙකක්** ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv) දෙවැනි නාගරීකරණ සමයේ **ආර්ථික ආගමික** හා **සාහිත්‍ය** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 6)

05. (i) යාබද සිතියමේ A, B, C වලින් දක්වෙන ලන්දේසි බලකොටු තුන අනුපිළිවෙළින් නම් කරන්න.




www.edudept.up.gov.lk

(ii) A, B, C, D වලට අදාළ පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

A - 1829 වසරේදී ලංකාවේ ආදායම වියදම පිළිබඳ සොයා බැලීම සඳහා පැමිණි තැනැත්තා

B - යුරෝපීය උද්ඝෝෂණ සඳහා 1865 දී ලංකා සංගමය පිහිටවූ ඉංග්‍රීසි ජාතිකයා

C - 1908වසරේදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බව දන්වා යටත් විජිත භාර මහ ලේකම්වරයාට පෙත්සමක් ඉදිරිපත් කළ තැනැත්තා

D - 1935 දී ලංකා සමසමාජ පක්ෂය පිහිටවූ වාමාංශික නායකයා (ලකුණු 4)

(N.M.පෙරේරා, W.M.G.කෝල්බෲක්, පෙඩ්රික් නෝත්, ජේම්ස් පීරිස්, E.A.ගුණසිංහ ජෝර්ජ් වෝල්, )

(iii) 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වාදුන් නව අංග දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iV) 1956 මැතිවරණයෙන් පසු සඳහන් අංශ සම්බන්ධයෙන් මෙරට සිදුවූ වෙනස්කම් එක බැගින් පැහැදිලි කරන්න.

- ආර්ථික
- දේශපාලන
- සමාජ (ලකුණු 6)

**ශශශ කොටස**

08. (i) පහත A,B,C වලට අදාල නිවැරදි පිළිතුර ලියන්න.

A - මධ්‍යතන යුගයේ අවසාන භාගයේ යුරෝපයේ පැවති දියුණු වෙළඳ නගරය

B - කලාත්මක කටයුතු සඳහා අතහිත දුන් ඉතාලියේ ධනවත් පවුල

C - පුනරුද යුගයේදී කතෝලික සභාවේ දුර්වලතා විවේචනයට ලක් කළ ජර්මන් ජාතිකයා (ලකුණු 3)

(ii) පහත දැක්වෙන නව සොයා ගැනීම් කළ පුද්ගලයින් කවුරුන්දැයි A,B,C,D අනුපිළිවෙලින් ලියන්න.

A - බ්‍රහස්පති ග්‍රහයාට උප ග්‍රහයින් ඇති බව සහ චන්ද්‍රාවාට පිළිබඳ සොයා ගැනීම

B - ලෙඩරෝග සෑදීමට තුඩු දෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම පිළිබඳ අත්හදා බැලීම

C - ජේම්ස්වොට් ඔහුගේ වාෂ්ප එන්ජිම නිපවීමට ආභාෂය ලබාගත්,වාෂ්ප එන්ජිම නිපදවූ තැනැත්තා

D - ජෙනී යන්ත්‍රය හා ජලරාමුව යන යන්ත්‍ර දෙකෙහි මූල ධර්මය ප්‍රයෝජනයට ගනිමින් සැකසූ නූල් කටින යන්ත්‍රයේ නම

(ලකුණු 4)

(iii) පුනරුදය නිසා යුරෝපයේ ඇතිවූ දේශපාලන නවෝදය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 5)

(iV) යුරෝපයේ ඇතිවූ කාර්මික විප්ලවය මානව සමාජ ක්ෂේත්‍රයේ ඇති කළ යහපත් ප්‍රතිඵල **දෙකක්** හා **එක්** අහිතකර ප්‍රතිඵලයක් පහදන්න. (ලකුණු 6)

09. (i) පහත A,B,C වලට අදාල නිවැරදි පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A - ඇමෙරිකන් විප්ලවයේ ආරම්භයට බලපෑ සිදුවීම

B - ' මා අපේක්ෂා කරනඕනෑම දෙයක් නීත්‍යානුකුලයි' ලෙස ප්‍රකාශ කළ ප්‍රංශ අධිරාජයා


C - රුසියාවේ දූෂිත ඒකාධිපති පාලනයක් ගෙන ගිය රාජ පරම්පරාව (ලකුණු 3)

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

www.edudept.up.gov.lk

(iii) පළමු ලෝක සංග්‍රාමය ඇතිවීමට බලපෑ එක් හේතුවක් සහ පළමු ලෝක සංග්‍රාමයේ එක් ප්‍රතිඵලයක් විස්තර කරන්න. (ලකුණු 5)

(iV) දෙවන ලෝක යුද්ධයෙන් පසුව ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ගත් එක්සත් ජාතීන්ගේ ආයතන අතුරෙන් ආයතන තුනක කාර්යභාරය පෙන්වා දෙන්න. (ලකුණු 6)





© 2009 www.outline-world-map.com